# DEMAND, SUPPLY, ELASTICITY AND MARKET EQUILIBRIUM (Part-V)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

# හරස් මිල ඉල්ලුම් නම්‍යතාව

වෙළෙඳපොළේ හුවමාරු වන එක් භාණ්ඩයක මිල වෙනස් වීම තවත් භාණ්ඩයක ඉල්ලුම වෙනස් වීමට බලපායි.

ඉල්ලුම කෙරෙහි බලපාන අනෙකුත් සාධක ස්ථාවර ව තිබිය දී සම්බන්ධිත භාණ්ඩයක මිලේ ප්‍රතිශතක වෙනසට සාපේක්ෂ ව සලකා බලන භාණ්ඩයේ ඉල්ලුමේ ප්‍රතිශතක වෙනස මැන දැක්වීම හරස් මිල ඉල්ලුම් නම්‍යතාව ලෙස හැදින්වේ.

## හරස් මිල ඉල්ලුම් නම්‍යතාව ගණනය කළ හැකි සූත්‍රය

$$E_{xy} = \frac{\Delta Qx}{\Delta Py} \times \frac{Py}{Qx}$$

$Exy$ = හරස් මිල ඉල්ලුම් නම්‍යතාව

$\Delta Qx$ = සලකා බලන භාණ්ඩයේ ඉල්ලුමේ වෙනස

$\Delta Py$ = සම්බන්ධිත භාණ්ඩයේ මිලේ වෙනස

$Py$ = සම්බන්ධිත භාණ්ඩයට කලින් පැවැති මිල

$Qx$ = සලකා බලන භාණ්ඩයට කලින් පැවති ඉල්ලුම

ClassWork.LK

# <u>හරස් මිල ඉල්ලුම් නම්‍යතා සංගුණකය සහා භාණ්ඩ වර්ග</u>

හරස් මිල ඉල්ලුම් නම්‍යතා සංගුණකය ධන අගයක් ගනු ලබන්නේ සම්බන්ධිත භාණ්ඩවල මිල හා සලකා බලන භාණ්ඩයේ ඉල්ලුම අතර අනුලෝම සම්බන්ධයක් පවතින භාණ්ඩවල ය.

එසේ හරස් මිල ඉල්ලුම් නම්‍යතා සංගුණකය ධන අගයක් ගනු ලබන්නේ **ආදේශන භාණ්ඩවල** ය.

හරස් මිල ඉල්ලුම් නම්‍යතා සංගුණකය සෘණ අගයක් ගනු ලබන්නේ සම්බන්ධිත භාණ්ඩවල මිල හා සලකා බලන භාණ්ඩයේ ඉල්ලුම අතර ප්‍රතිලෝම සම්බන්ධයක් පවතින භාණ්ඩවල ය.

එසේ හරස් මිල ඉල්ලුම් නම්‍යතා සංගුණකය සෘණ අගයක් ගන්නේ **අනුපූරක භාණ්ඩවල** ය.

ClassWork.LK

# හරස් මිල ඉල්ලුම් නම්‍යතා සංගුණකයේ ප්‍රායෝගිකව වැදගත් වන ආකාර

- භාණ්ඩ වර්ග අතර පවතින අන්තර් සම්බන්ධතාව විග්‍රහ කිරීමට

- භාණ්ඩ සඳහා වෙළෙඳපොළේ තරගකාරීත්වය තීරණය කිරීමට

- භාණ්ඩවල හා සේවාවල සාපේක්ෂ ඉල්ලුම වෙනස් වීම් පුරෝකථනය කිරීමට

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති
## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura